# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,932/7 — 1970 නොවැම්බර් 19 වැනි බ්‍රහස්පතින්ද — 1970.11.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)

## පළාත් පාලන නිවේදන

එල්පීඩී/බීසී/3/6/3

### නගර සභා ආඥාපනත

### 184 වන වගන්තිය යටතේ ආඥාව

1968 අංක 42 දරන පනතින් සංශෝධනය කරන ලද (255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 184 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම ඉහත කී වගන්තිය යටතේ වත්තේගම, නගරය සම්බන්ධයෙන් පනවනු ලැබ, 1970 ඔක්තෝබර් මස 13 වැනි දින අංක 14,927/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවේ අන්තිම ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් එය මෙයින් සංශෝධනය කරමි :—

" (ආ) ඒ නගරය සඳහා එකී ආඥාපනත යටතේ අලුත් නගර සභාවක්, සංස්ථාපනය කර ගන්නා තුරු, වත්තේගම නගරයේ කටයුතු පාලනය කිරීම පිණිස ද, ඒ කාර්‍ය්‍යය සඳහා එකී ආඥාපනත යටතේ නගර සභාවක බලතල ක්‍රියාවෙහි යෙදවීම සහ යුතුකම් ඉටු කිරීම පිණිස ද, විශේෂ කොමසාරිස්වරයා වශයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් කුමාරසිංහ පුංචිබන්ඩා මහතා පත් කරමි.

1970 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

ෆී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති.

11–1012


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.

822/3—ජේ 18645—5,675 (70/11)